**<u>උතුරු මැද පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම-2023 (II අදියර)</u>**

ඉහත බඳවා ගැනීමට අදාළව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් 2023.10.27 දින "දිනමිණ", "තිනකරන්" හා "ඩේලිනිවුස්" පුවත්පත්වල පළ කරන ලද නිවේදනයේ උපලේඛන අංක 02හි අධ්‍යාපන සුදුසුකම් (ඉංග්‍රීසි විෂය සඳහා) සංශෝධනය කර ඇත.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2023.11.29 දක්වා දීර්ඝ කර ඇත.

| විෂය | උපලේඛන 1 හි සඳහන් සුදුසුකම් | **සංශෝධනය විය යුතු ආකාරය** |
|---|---|---|
| ඉංග්‍රීසි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධියක්<br>හෝ<br>ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම<br>හෝ<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමඟ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මඟින් පිරිනමන ලද ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි) දෙවසරක පූර්ණ කාලීන පාඨමාලාව සහ හය මසක පාසල් පාදක ගුරු පුහුණුව සම්පූර්ණ කර තිබීම<br>සහ<br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධියක්<br>හෝ<br>ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම<br>හෝ<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමඟ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මඟින් පිරිනමන ලද ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි) දෙවසරක පූර්ණ කාලීන හෝ <u>අර්ධ කාලීන</u> පාඨමාලාව<br>සහ<br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම |

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.